| | |
|---|---|
| කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර | බහුවරණ ප්‍රශ්න සංග්‍රහය |
| විෂය- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | ශ්‍රේණිය - 13 |
| සකස් කළ ගුරුභවතාගේ නම - නෙළුම් කුමාරි මිය<br>පාසල - ර/ ඇහැලියගොඩ ම.ම.වි. | නිපුණතා මට්ටම 9.1- විවිධ නීති ක්ෂේත්‍රයන්හි ස්වභාවය |

01. නීතිමය විනිශ්චයන්ට පදනම් වූ නිවැරදි ප්‍රකාශය වන්නේ,

I. සියැසින් දුටු සාක්ෂි වල වැරදි සිදු නොවේ.

II. නීතිමය භාෂාව ව්‍යවස්ථාපිතය.

III. නීතිමය විනිශ්චයන්හිදී සාක්ෂි වල අදාළත්වය නොසැලකේ.

IV. මනෝභාවයන් නීතිමය භාෂාවේ දක්නට ඇත.

V. සියැසින් දුටු සාක්ෂි සනාථ කිරීමට අනියම් සාක්ෂි ප්‍රයෝජනවත් නොවේ.

02. නීතිමය විනිශ්චයන්හි දී,

I. ජීවත්ව සිටින අයෙකු පිළිබඳ වෛද්‍ය සාක්ෂි ඉදිරිපත් කළ නොහැකිය.

II. ලේඛනගත සාක්ෂි ප්‍රත්‍යක්ෂ සාක්ෂි ලෙස සැලකේ.

III. අපරාධයක් සිදු වූ තැන තිබූ හිසකේ ගසක් අනියම් සාක්ෂියකි.

IV. චරිත ශෝධනයන් අරමුණු කර දඬුවම් දීම යුක්ත නොවේ.

V. පාපොච්චාරණය හේතුවෙන් විත්තිකරු නිදහස් වෙයි.

03. සිවිල් නඩුවක දී චූදිතයා වැරදිකරු කිරීමට අනුගමනය කරන පදනම කුමක් ද?

I. සියැසින් දුටු සාක්ෂි 100%ක් සම්භාවිතාවයකින් ඔප්පු කිරීම

II. අනියම් සාක්ෂි 50% ක් සම්භාවිතාවයකින් ඔප්පු කිරීම.

III. සාක්ෂි 50% ක් සම්භාවිතාවකින් ඔප්පු වීම.

IV. සියැසින් දුටු සාක්ෂි 50% ක වැඩි සමභාවිතාවකින් ඔප්පු වීම.

V. වෛද්‍ය සාක්ෂි මත පමණක් ඔප්පු වීම.

04. නීතිමය විනිශ්චයේ අනියම් සාක්ෂියක්,

I. යම් කරුණක් සනාථ කිරීමට ඉදිරිපත් කරන අධ්‍යාපන සහතිකය.

II. අපරාධයක් කිරීම පිළිබඳ ඇසින් දුටු සාක්ෂිය.

III. අපරාධකරු තමා වැරදිකරු බව පිළිගනිමින් කරන ප්‍රකාශය

IV. විත්තිකරු මානසික රෝගියෙකු බව සනාථ කෙරෙන වෛද්‍යවරයෙකුගේ වාර්තාව

V. අපරාධයක් සිදු වූ තැන තිබූ ලේ තැවරුණු පිහියක් ඉදිරිපත් කිරීම.

05. සියැසින් දුටු සාක්ෂියක් වන්නේ,

I. වෛද්‍යවරයෙකු මැණයට හේතු දක්වමින් දෙනු ලබන සහතිකය.

II. අපරාධයක් සිදු වූ ස්ථානයකින් හමු වූ පිහියක් ඉදිරිපත් කිරීම.

III. තමන් පෙරළා චූදිතයා පලා යෑම පිළිබඳ කෙරෙන ප්‍රකාශය.

IV. උසාවියට ඉදිරිපත් කරන උප්පැන්න සහතිකයක්

V. පොලිස් වාර්තා

06. පියදස තමාට වෙඩි තබා මරණ බවට තර්ජනය කළේ යයි සිද්ධියෙන් මිය ගිය පියසෝම කලින් දිනක තමාට

පැවසූ බව සයිමන් ප්‍රකාශ කරයි. මෙහි සඳහා සයිමන්ගේ සාක්ෂිය,

I. ඍජු සාක්ෂියකි. II. සාක්ෂියකි. III. ප්‍රමාදක සාක්ෂියකි.

IV. අනන්‍යතාව තහවුරු කරන සාක්ෂියකි. V. මරණාසන්න ප්‍රකාශයකි.

07. මිනීමැරුම් නඩු විභාගයක දී අදාළ වුවත් එතරම් වැදගත් සාක්ෂියක් නොවන්නේ,

I. ඇසින් දුටු සාක්ෂි II. අනියම් සාක්ෂි

III. වෛද්‍ය සාක්ෂි IV. විත්තිකරු අපරාධයට පෙර කරන ලද ප්‍රකාශ

V. විත්තිකරුගේ පාපොච්චාරණය

08. නීතිමය වශයෙන් දඬුවම් පිළිබඳ විග්‍රහයන්ට අයත් නොවන වාදය මින් කුමක් ද?

I. නිවරණාත්මක වාදය II. ප්‍රතිඵලාත්මක වාදය III. උද්ගමන වාදය IV. ප්‍රතිසංස්කරණ වාදය V. උපයෝගිතා වාදය

09. සිවිල් නඩුවක් ඔප්පු කිරීමේ දී අනුගමනය කරන පදනම වන්නේ,

I. ඉදිරිපත් වන සාක්ෂි වල නිරවද්‍යතාවය 80% විය යුතුය.

II. ඉදිරිපත් වන සාක්ෂි වල නිරවද්‍යතාවය 100% විය යුතුය.

III. ඉදිරිපත් වන සාක්ෂි වල නිරවද්‍යතාවය 50% විය යුතුය.

IV. ඉදිරිපත් වන සාක්ෂි සාධාරණ සැකයකින් තොරව ඉදිරිපත් කළ යුතුය.

V. සියැසින් දුටු සාක්ෂි මතම ඉදිරිපත් කර ඔප්පු කළ යුතුය.

10. අපරාධ නඩු විභාගයක දී ඍජු ප්‍රත්‍යක්ෂමය සාක්ෂියක් වශයෙන් සැලකෙන්නේ මෙයින් කුමක් ද?

I. අසා දැනගත් සාක්ෂි II. විශේෂඥ වෛද්‍ය සාක්ෂි

III. ඇසින් දුටු සාක්ෂි IV. DNA පරීක්ෂණයකින් ලැබුණු සාක්ෂි

V. හඳුනා ගැනීමේ පෙරට්ටුවක්

11. සිවිල් නඩුවකදී,

I. ඒත්තු ගැනීම සාක්ෂි වශයෙන් පිළිගනු නොලැබේ.

II. වග උත්තරකරුගේ චරිතය අදාළ කරුණක් නොවේ.

III. සාක්ෂි රීතීන් පාර්ශවකරුවන්ගේ හෝ අධිකරණයේ එකඟත්වය මත ලිහිල් කර ගැනීමේ අවකාශ

නොමැත.

IV. විදේශගතව සිටින සාක්ෂිකරුවන් ද අධිකරණය අභිමුඛයට වාර්තා කළ යුතුව ඇත.

V. මුද්දර ගාස්තු ගෙවිය යුතු ලේඛන එම කොන්දේසිය සපුරා නොතිබුණ ද පිළිගැනීමට ලක් වේ.

12. නීතිමය විනිශ්චයන්ට පදනම් වූ පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය කුමක් ද?

I. නීතිමය විනිශ්චයන්හි දී වාස්තවික බවක් ඇත.

II. නීතියේ ප්‍රධාන තර්ක ක්‍රමය නිගාමීය.

III. සියැසින් දුටු සාක්ෂි ප්‍රබල සාක්ෂි ලෙස සැලකේ.

IV. උසාවියේ විභාග වන්නේ අතීත සිද්ධීන්ට අදළ වන කරුණුය.

V. නීතියේ ප්‍රධානතම තර්කය උද්ගාමීය.

13. සියැසින් දුටු සාක්ෂිය යනු,

I. අපරාධයක් සිදු වූ ස්ථානයේ තිබී හමු වූ ද්‍රව්‍ය

II. අපරාධයක් සිදු කෙරුණු අන්දම තමන් දුටු බව යමෙකු පැවසීම.

III. මරණයට හේතු දක්වා ඉදිරිපත් කෙරෙන වෛද්‍ය වාර්තාව

IV. අපරාධකරුවෙකු තමා වරද කළ බව පිළිගනිමින් කරන ප්‍රකාශනය

V. යම් කරුණක් සනාථ කිරීමට ඉදිරිපත් කරන උප්පැන්න සහතිකය

14. සාවද්‍ය කරුණ කුමක් ද?

I. ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීම සෑහේ.

II. ඒත්තු ගැන්වීම සාක්ෂි ලෙස පිළිගැනේ.

III. විදේශගතව සිටින සාක්ෂිකරුවෙකුට කොමිසමේ මාර්ගයෙන් සාක්ෂි ලබා දිය හැකිය.

IV. සාක්ෂි රීතීන් අධිකරණයේ අවසරය ඇතිව හෝ පාර්ශවකරුවන්ගේ එකඟත්වය මත ලිහිල් කරගත හැකිය.

V. වගඋත්තරකරු අභිමුඛයේ දී පැමිණිලිකරු කරන ප්‍රකාශ ඇතුළත් කරගත හැකිය.

15. බැංකුවක් බිඳීම පිළිබඳ නඩු විභාගයක දී,

A - චූදිතයා දින කීපයක් බැංකුවක් අසළ ගැවසීම.

B - ආයුධ සොයා කීප විටක් ඒවා පරීක්ෂා කිරීම.

C - සේප්පු විවෘත කරන ආකාරය පුහුණු වීම.

D - පුහුණු කරන ලද තැනැත්තා චූදිතයා ලෙස හඳුනා ගැනීම.

ඉහත සාක්ෂි,

I. අනියම් සාක්ෂිය II. ප්‍රත්‍යක්ෂ සාක්ෂිය III. වෛද්‍ය සාක්ෂිය

IV. ලේඛනගත සාක්ෂිය V. සියැසින් දුටු සාක්ෂිය

**පිළිතුරු**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 - | (1) | 2 | 3 | 4 | 5 |
| 2 - | 1 | 2 | (3) | 4 | 5 |
| 3 - | 1 | 2 | 3 | (4) | 5 |
| 4 - | 1 | 2 | 3 | 4 | (5) |
| 5 - | 1 | 2 | (3) | 4 | 5 |
| 6 - | 1 | 2 | 3 | 4 | (5) |
| 7 - | 1 | 2 | 3 | (4) | 5 |
| 8 - | 1 | 2 | (3) | 4 | 5 |
| 9 - | 1 | 2 | (3) | 4 | 5 |
| 10 - | 1 | 2 | 3 | (4) | 5 |
| 11 - | 1 | (2) | 3 | 4 | 5 |
| 12 - | 1 | (2) | 3 | 4 | 5 |
| 13 - | 1 | (2) | 3 | 4 | 5 |

14 - 1 2 3 4 (5)

15 - (1) 2 3 4 5